පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි විෂය නිර්දේශය) - 2019
B.A.GENERAL DEGREE EXAMINATION. (EXTERNAL- old Syllabus) - 2019

## GEOGRAPHY 4/භූගෝල විද්‍යාව 4 - ( GG IV)
## (SOUTH ASIA/දකුණු ආසියාව)

**උපදෙස්:**
සෑම කොටසකින්ම එක් ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්යයි. මෙම ප්‍රශ්න පත්‍රයේ ඇතුලත් මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතකි (07). දකුණු ආසියානු සිතියමක් සපයනු ලැබේ.
**කාලය : පැය 03 යි.**

---

### I කොටස

(01) දෙන ලද දකුණු ආසියානු සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කොට නම් කරන්න ( ලකුණු 25)

i. දකුණු ආසියාවේ දූපත් රාජ්‍ය දෙකක් (ලකුණු 02)
ii. බෙංගාල බොක්ක සහ කැම්බේ බොක්ක (ලකුණු 02)
iii. මලබාර් වෙරළ සහ කොරමැන්ඩල් වෙරළ (ලකුණු 02)
iv. බැංගලෝරය, හයිද්‍රාබාද්, චෙන්නායි, නවදිල්ලි නගර (ලකුණු 04)
v. සුලෙයිමාන් සහ පැට්කායි කඳු පන්ති (ලකුණු 04)
vi. ඉන්දු ගංගාව (ලකුණු 02)
vii. දමෝදාර් කාර්මික ප්‍රදේශය (ලකුණු 02)
viii. ඉන්දියාවේ තේ වවන ප්‍රධාන ප්‍රදේශ දෙකක් (ලකුණු 02)

පහත සඳහන් ස්ථානවල භූ රූපමය ස්වභාවය පෙන්වීමට දළ හරස්කඩ තුනක්, සිතියමේ දෙනලද ස්ථාන භාවිතා කර ඇඳ දක්වන්න.

i. A – B (ලකුණු 01)
ii. C – D (ලකුණු 02)
iii. E – F (ලකුණු 02)

### II කොටස

(02) i. දකුණු ආසියාවේ භෞතික උප ප්‍රදේශ හතර මොනවාද? සිතියමක් ඇසුරින් ඒවායේ වෙනස් ලක්ෂණ විභාග කරන්න. (ලකුණු 08)

ii. ගංගා නිම්නයේ භෞතික පිහිටීම පැහැදිලි කොට කෘෂිකර්මාන්තයට එහි යෝග්‍යතාව විස්තර කරන්න. (ලකුණු 17)

(03) i. රූප සටහනක් ඇසුරින්, දකුණු ආසියාවේ සුළි සුළං රටාව විභාග කරන්න. (ලකුණු 10)

ii. බෙංගාල බොක්කේ කාලගුණික අස්ථායිතාවේ බලපෑම අවට රටවලට බලපාන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(04) පසුගිය දශක දෙක තුල දකුණු ආසියානු කලාපය මුහුණදුන් පාරිසරික අර්බුද පහක් යෝග්‍ය උදාහරණ සමගින් සාකච්ඡා කරන්න. (ලකුණු 25)

**III කොටස**

(05) "මෑත කාලීන සමාජ දේශපාලනික අසහනය නිසා දකුණු ආසියානු කලාපය, ගැටුම්කාරී ප්‍රදේශ වලින් එකක් බවට පත්ව ඇත" මෙම කියමන විචාරාත්මකව විභාග කරන්න. (ලකුණු 25)

(06) පහත වගුව මගින් දකුණු ආසියානු රටවල ද.දේ.නි. වර්ධනය දැක්වේ (ලෝක බැංකු දත්ත අනුව). මේ තත්වය විචාරාත්මකව විභාග කොට එයට පසුබිම් වූ හේතු සහ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 25)

දකුණු ආසියානු රටවල සාමාන්‍ය ද.දේ.නි. වර්ධනය 2014-2018

| | රට | සාමාන්‍ය ද.දේ.නි. වර්ධනය (2014-2018) | ද.දේ.නි. වර්ධනය (2018 පමණි) |
|---|---|---|---|
| 1 | ඇෆගනිස්ථානය | 2.6 | 1.0 |
| 2 | බංගලාදේශය | 6.5 | 7.9 |
| 3 | භූතානය | 5.8 | 5.7 |
| 4 | ඉන්දියාව | 7.4 | 7.2 |
| 5 | මාලදිවයින | 5.7 | 7.9 |
| 6 | නේපාලය | 5.4 | 6.3 |
| 7 | පාකිස්තානය | 4.8 | 5.8 |
| 8 | ශ්‍රී ලංකාව | 6.0 | 3.2 |

(07) ප්‍රදේශයක් ලෙසට, දකුණු ආසියානු රටවල් මෑත කාලීනව මුහුණ දුන් සමාජ ආර්ථික අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 25)